# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2368/22 - 2024 ජනවාරි මස 24 වැනි බදාදා - 2024.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වන වගන්තිය සමග කියවිය යුතු 41 වන වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය.

හරින් ප්‍රනාන්දු (පා. ම.),
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2024 ජනවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය හරීන් ප්‍රනාන්දු වන මම, 2023 ජූලි මස 28 දිනැති හා අංක 2342/48 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* හා 2023 අගෝස්තු මස 09 දිනැති හා අංක 2344/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන අතර එමගින් පහත සඳහන් ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන්හි බලතල, කාර්යයන් සහ රාජකාරි ඉටු කිරීම සඳහා පත් කරන ලද අතුරු කමිටු විසුරුවා හරිනු ඇත.

1. ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනය
2. ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා

1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ වලංගු ක්‍රීඩා නියෝග ප්‍රකාරව ඉහත ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන්හි ව්‍යවස්ථාවට අනුව නීත්‍යානුකූල නිල කාලය අවසන් වී නැවත නිලවරණය පවත්වන තෙක් මීට පෙර පැවති නිලවරණයෙන් තේරී පත් වූ නිලධාරී මණ්ඩලය වෙත එකී සංගමයේ/සම්මේලනයේ කටයුතු ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා මෙයින් බලය පවරමි.

EOG 01 - 0210

1A - G 41315 — 07 (2024/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*